Telephones 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / E-mail info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல.1200/9, இராஜமல்வத்தை வீதிபத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/11/AT/Reg.Gen.Dpt/2026
ඔබේ අංකය / உமது இல. / Your No. HA/05/20/01/01/20
දිනය / திகதி / Date 2026.05.26

10 JUN 2026

5016/12

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය (ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්)/ රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I හා II ශ්‍රේණිය, (අතිරේක දිස්ත්‍රික්/ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්)/ ලේඛන සහකාර සේවය III/II**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබගේ සමාංක හා 2026.01.16 දිනැති ලිපිය හා බැඳේ.

02) ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මෙම සියලු 2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මෙ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

05) 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06) වාර්ෂික ස්ථාන මාරු නියෝග නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

/6.

07) එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08) ඔබගේ සමාංක හා 2026.01.16 දිනැති ලිපිය මගින් 2026 ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දිනය 2026.04.01 දින දක්වා දීර්ඝ කිරීමටත් ඊට පසු දිනක ක්‍රියාත්මක වීමට නියමිත ස්ථාන මාරු චක්‍ර එකී නියෝගයන්හි සඳහන් දින සිට ක්‍රියාත්මක කිරීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. එම ඉල්ලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව